ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

පුවත්පත් නිවේදනය

ඉන්දියානු ජාත්‍යන්තර රෙදිපිළි ප්‍රදර්ශනය 2019 ජූලි 29 -31 කොළඹ ගලදාරි හෝටලයේදී

ඉන්දියානු ජාත්‍යන්තර රෙදිපිළි ප්‍රදර්ශනය (IITExpo) සහ විකුණුම් සහ ගැනුම්කරුවන්ගේ හමුව කොළඹ ගලදාරි හෝටලයේදී ඊයේ සමාරම්භ කෙරිණ. තෙදිනක් පුරා පැවැත්වෙන මෙම ප්‍රදර්ශනය ඉන්දියාවේ පවර්ලූම් සංවර්ධන සහ අපනයන ප්‍රවර්ධන කවුන්සිලය (Powerloom Development & Export Promotion Council - PDEXCIL) විසින් ඉන්දියානු රජයේ රෙදිපිළි අමාත්‍යාංශයේ සහ වාණිජ සහ කර්මාන්ත අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව සංවිධානය කර තිබේ.

සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු අනෝමා ගමගේ මහත්මිය සහභාගී විය. ඒකාබද්ධ රෙදිපිළි සංගමයේ සභාපති ශාරද් අමාලීන් මහතා , ශ්‍රී ලංකා රෙදිපිළි අපනයන සංගමයේ සභාපති රෙහාන් ලබානි මහතා , ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ආර්ථික සහ වාණිජ අංශයේ ප්‍රධානී සුජා කේ . මෙනන් මහත්මිය සහ PDEXCIL සභාපති සුනිල් සත්ගොන්ඩා පටිල් මහතා ද මෙම අවස්ථාවට එක් විය.

උත්සව සභාව ඇමතූ ගරු අනෝමා ගමගේ මහත්මිය දළ දේශීය නිෂ්පාදනයට, අපනයනයන්ට, විදේශ විනිමය ඉපැයීම් වලට සහ රැකියා උත්පාදනයට රෙදිපිළි කර්මාන්තය ලබාදෙන දායකත්වය සැලකීමේදී එය ශ්‍රී ලංකා ආර්ථිකයේ ඉතා වැදගත් ක්ෂේත්‍රයක් බව පෙන්වා දුන්නාය . ශ්‍රී ලංකා

රජයේ 2025 දැක්ම පිළිබඳව සැලකීමේදීද එහි අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීමේදී රෙදිපිළි කර්මාන්තය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරන බව එතුමිය ප්‍රකාශ කළාය. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ශක්තිමත් ද්විපාර්ශවීය සම්බන්ධතාවයක් තිබෙන බව පැවසූ එතුමිය රෙදිපිළි ක්ෂේත්‍රය තුළ තවදුරටත් ශක්තිමත් සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමෙ අවස්ථාවන් පවතින බවද සඳහන් කළාය. රෙදිපිළි කර්මාන්තය සමග වසර 25 කට ආසන්න කාලයක් පුරා පවතින සිය පෞද්ගලික සම්බන්ධතාවය පිළිබඳවද එතුමිය සිහිපත් කළාය

අමුද්‍රව්‍ය සහ නිෂ්පාදන සම්බන්ධයෙන් ඉන්දියාව සතු ශක්තීන් සහ නිකේතන වෙළඳපොළ තුළ සාර්ථක වීමට ශ්‍රී ලංකාව සතු හැකියාව පිළිබඳව සැලකීමේදී රෙදිපිළි සහ ඇඟළුම් ක්ෂේත්‍රය තුළ දෙරට අතර මනා සුසංයෝගයක් පවතින බව සුජා කේ. මෙනන් මහත්මිය ප්‍රකාශ කළාය. ශ්‍රී ලාංකික සමාගම් කිහිපයක්ම ඉන්දියාවෙ රෙදිපිළි ක්ෂේත්‍රය තුළ ආයෝජනය කර ඉන්දියානු ආර්ථිකයට දායකත්වය ලබා දී ඇති බවද එතුමිය සඳහන් කළාය.

PDEXCIL 1998 වසරේ සිට දිගු කාලයක් පුරා ශ්‍රී ලංකාව සමග කටයුතු කරයි. PDEXCIL සහ ශ්‍රී ලංකා ඇඟළුම් අපනයන සංගමය අතර අවබෝධතා ගිවිසුමක්ද පවතින අතර එම අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලද්දේ 2017 ජූනි මාසයේදී ගුජරාටයේදීය.

මෙම ප්‍රදර්ශනයේදී ඉන්දියාවේ විවිධ රෙදිපිළි පර්ෂදයන්ගෙන් ප්‍රදර්ශකයන් 30 ක් පමණ විවිධ රෙදි වර්ග, ඇඟළුම් සහ නිවසට අවශ්‍ය කරන රෙදිපිළි යනාදිය ප්‍රදර්ශනය කර ඇත.

මෙම ප්‍රදර්ශනය 2019 ජූලි 31 වන දින දක්වා පැවැත්වේ.

*****

කොළඹ

2019 ජූලි 29